සැ. යු.– මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2002 වර්ෂයේ මුද්‍රිත පොත් නාමාවලියේ ජූලි - සැප්තැම්බර් කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,501— 2007 ජූනි 08 වැනි සිකුරාදා — 2007.06.08

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 540 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 543 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජූනි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජූනි මස 01 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

537 -B 079505- 9,600 (2007/06)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2**. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3**. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5**. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**6**. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලෑජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විවාහ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ තනතුර - රත්නපුර දිස්ත්‍රික්කය

අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1457 හා 2006 අගෝස්තු මස 04 වන සිකුරාදා දිනැති *ගැසට් පත්‍රයේ* I කොටසේ (IIඅ) ඡේදයේ මා විසින් පළකරන ලද රත්නපුර දිස්ත්‍රික්කයේ විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසවල නව බඳවාගැනීමේ පරිපාටිය අනුව කටයුතු කිරීම සඳහා අයදුම්පත් කැඳවීම අවලංගු කරමි. (මෙම කොට්ඨාස නැවත *ගැසට් පත්‍රයේ* පළකිරීමට කටයුතු කරනු ලැබේ.)

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාස හා තනතුර* |
|---|---|---|---|
| 01. | රත්නපුර | රත්නපුර | ගිලීමලේ දකුණ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කුරුවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට හා සාමාන්‍ය ) රෙජිස්ට්‍රාර් ධූරය |
| 02. | රත්නපුර | ඇඹිලිපිටිය | පල්ලෙබැද්ද කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ අටකලන් කෝරළය කොට්ඨාසයේ විවාහ ( උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය |
| 03. | රත්නපුර | කොලොන්න | කැම්පනේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කොලොන්න කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය |

එල්.. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 මැයි මස 15 වැනි දින,
කොළඹ 11,
කෙලින් වීදිය,
අංක 280, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු වේ දී ය.

06 – 189

---

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

රාජ්‍ය සංගීත කණ්ඩායමට ශිල්පි/ශිල්පිනීන් බඳවා ගැනීම –සංශෝධනය

2007.02.09 දිනැති අංක 1484 දරන *රජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද “ රාජ්‍ය සංගීත කණ්ඩායමට ශිල්පි/ශිල්පිනියන් බඳවා ගැනීම ” යටතේ පළ කරන ලද දැන්වීමෙහි තුන්වැනි ඡේදයේ සඳහන් වයස් සීමාව මෙයින් සංශෝධනය කරනු ලැබේ. එහි, “3. වයස් සීමාව.– 2007.02.28 දිනට අවුරුදු 18-25 අතර විය යුතුය” යන්න අවුරුදු 18-30 අතර ලෙස සංශෝධනය කරමි.

02. එහි සඳහන් වන අනෙකුත් කොන්දේසි ඒ ආකාරයෙන්ම පවතිනු ඇත.

03. එකී *ගැසට් නිවේදනයේ* සඳහන් ආදර්ශ ආකෘතියට අනුව සැකසූ අයදුම්පත් 2007.06.22 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ “අධ්‍යක්ෂ, සංස්කෘතික දෙපාර්තමේන්තුව, 08 වන මහළ, සෙත්සිරිපාය, බත්තරමුල්ල” යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ “රාජ්‍ය සංගීත කණ්ඩායමට අයදුම් කිරීම ” ලෙස සඳහන් කළ යුතුය.

ඊ. එම්. අභයරත්න,
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ.

2007 මැයි මස 23 වැනි දින,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

06 –227

---

## සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය

සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතන වල පුරප්පාඩු පවතින සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත්‍රය මෙහි ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව විය යුතු අතර, අයදුම්පත් 2007.07.16 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්, "සුවසිරිපාය", අංක 385,පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරි තනතුර" යන්න සඳහන් විය යුතුය.

01. *වැටුප*.- රු. 14,930-150 x 7 - 240 x 9 - 290 x 10- 320x15- x 25,840 (රා.ප.ච.ලේ. 06/2006 අනුව MT -06-2006)

02. *වයස*.- අවුරුදු 18 ට වැඩි හා 45 ට අඩු විය යුතුය. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

03. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

1. *පශ්චාත් උපාධි/ඩිප්ලෝමා රහිත*

(අ) රාජකීය සෞඛ්‍ය සංගමයේ (එංගලන්තය) මහජන සෞඛ්‍ය පරීක්ෂක සහතිකය හෝ කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ඩිප්ලෝමා සහතිකය හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෙදකම පිළිබඳ ප්‍රවීණතා සහතික හෝ පවුල් සෞඛ්‍ය සේවිකාවක් වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සහතිකය හෝ ළමා දන්තාරක්ෂාව පිළිබඳ නිවාරණ හා ශල්‍ය සිද්ධාන්ත සහ ශිල්පන න්‍යාය විෂයක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම ;

*සහ*

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් විද්‍යා හෝ කලා විෂයයන්ගෙන් උපාධියක් ලබා තිබීම සහ පූර්ණ කාලීන සෞඛ්‍ය අධ්‍යාපන කටයුතුවල එක් අවුරුදු පළපුරුද්දක් තිබීම.

11. *පශ්චාත් උපාධි ශාස්ත්‍රපති හෝ ඩිප්ලෝමා සහිත.*

ඉහත 03, 1 අ, ආ සුදුසුකම් වලට අමතරව, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් ශාස්ත්‍රපති උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

04. *කාර්යක්ෂමතා කඩඉම* .- මෙම තනතුරට පත්වූ දින සිට වසර 03 ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* .- සුදුසුකම් ලත් අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කළ ලකුණු දීමේ ක්‍රමය පදනම් කරගත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගන්නා අතර, එම ලකුණු දීමේ පදනම පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| 1. | සම්මුඛ පරීක්ෂණය | 10 |
| 2. | පූර්ණ කාලීනව සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරියකුගේ වැඩ ආවරණය කිරීම. (එක් අවුරුද්දකට වඩා වැඩි අවුරුද්දක් සඳහා ලකුණු 05 බැගින් උපරිම ලකුණු - 25) | 25 |
| 3. | 1. පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය - 20<br>11. සමාජසේවා විද්‍යාලයෙන් සමාජ සේවා පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ පිළිගත් ආයතනයකින් ලබා ඇති ඊට සමාන ඩිප්ලෝමා සහතිකය - 10 | 20 |
| 4. | *පර්යේෂණය හා අධ්‍යයනයන් සඳහා* :-<br>1. විෂයයට අදාළව තමන් විසින් කරන ලද පර්යේෂණ හා ප්‍රකාශන සඳහා එකකට ලකුණු 05 බැගින් | උපරිම 15 |
| 5. | සෞඛ්‍ය අධ්‍යාපනය පිළිබඳ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | |
| 1. | ජාතික මට්ටමේ ඇගයීමට ලක්වූ ව්‍යාපෘති වලට ක්‍රියාකාරී දායකත්වය ලබාදීම සඳහා එක් ව්‍යාපෘතියකට ලකුණු 05 බැගින් | |
| 11. | පළාත් මට්ටමේ ඇගයීමට ලක්වූ සෞඛ්‍ය ව්‍යාපෘති සඳහා එක් ව්‍යාපෘතියකට ලකුණු 03 බැගින් | උපරිම 15 |
| 111. | දිස්ත්‍රික් මට්ටමේ ඇගයීමට ලක්වූ ව්‍යාපෘති සඳහා එක් ව්‍යාපෘතියකට ලකුණු 02 බැගින් | |
| 6. | භාෂා ප්‍රවීණතාවය :-<br>මව් භාෂාව හැර වෙනත් භාෂාවකින් වැඩ කිරීමේ හැකියාව සඳහා එක් භාෂාවකට ලකුණු 05 බැගින් | 15 |
| | | 100 |

06. *සේවා කොන්දේසි* :- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

07. දැනටමත් රජයේ සේවයේ නියුතු අයගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

08. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අතින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

වෛද්‍ය එච්. ඒ. පී. කහඳලියනගේ,
ලේකම්,
සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

2007 මැයි මස 24 වැනි දින,
සෞඛ්‍ය, ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

### සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී තනතුර

### ආදර්ශ අයදුම්පත්‍ර ආකෘතිය

01.(අ) මුලකුරු සමග අගට යෙදෙන නම :——————————.
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————.

02. ලිපිනය:-
(අ) පෞද්ගලික :——————————.
(ආ) රාජකාරී :——————————.
(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ /සංස්ථාවක නියුක්ත නිලධාරියෙකු ඔහුගේ රාජකාරී ලිපිනය යෙදිය යුතුයි. ලිපිනයේ වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතුයි.)

03. (අ) උපන් දිනය :——————————.
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :——————.
අවුරුදු:——————————.
මාස :——————————.
දින :——————————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

05. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :——————————.

06. සෞඛ්‍ය අධ්‍යාපන විෂයෙහි පළපුරුද්ද :——————————.

07. දැනට දරන තනතුරෙහි විස්තර :——————————.

(අ) තනතුර :——————————.

(ආ) දෙපාර්තමේන්තුව/ආයතනය :——————————.

(ඇ) පත්වීමේ දිනය :——————————.

(ඈ) ස්ථිර ද?/තාවකාලික ද? යන වග :——————————.

(ඉ) තනතුරේ ස්ථිර කර තිබේද? යන වග :——————————.

(ඊ) තනතුරේ වැටුප් පරිමාණය හා දැනට ලබන වැටුප :—————— ——————.

මෙම ඉල්ලුම්පතෙහි සපයා ඇති විස්තර සත්‍ය බවද, නිවැරදි බවද, මෙයින් සනාථ කරමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව මා තනතුරෙහි පත් කිරීමෙන් පසු සොයාගතහොත් එයින් මා තනතුරට නුසුදුස්සෙකු වන බවත්, කිසිම වන්දියක් නොමැතිව තනතුරෙන් පහ කරනු ලබන බවත්, මා දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

*අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තු සේවයේ නියුතු බැවින් ආයතන ප්‍රධානියාගේ වාර්තාව*

............................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ස්ථිර සේවයේ යෙදී සිටී. යම් ලෙසකින් මේ අය උක්ත තනතුර සඳහා තේරී පත්වන්නේ නම්, නිදහස් කිරීමට එකඟ වෙමි.

————————,
අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
නිළ අත්සන.

දිනය :————————.

06-244

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විවාහ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර් තනතුරු පුරප්පාඩු සඳහා අයදුම් පත් කැඳවීම් දැන්වීම් – අවලංගු කිරීම

මා විසින් විවාහ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර් තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම් පහත සඳහන් පරිදි ප්‍රසිද්ධ කරනු ලැබේ.

විවාහ උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමේ නව පරිපාටිය (2006) ක්‍රියාත්මක කිරීම සඳහා මෙම දැන්වීම් මගින් අයදුම්පත් කැඳවීම මෙයින් අවලංගු කරමි. මේ සඳහා මේ වනවිටත් අයදුම්කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ඔවුන් වෙත ලියාපදිංචි තැපැලෙන් ආපසු එවනු ලැබේ.

පුරප්පාඩු පිරවීම සඳහා නැවත අවශ්‍ය වුවහොත් ඒ සඳහා අවශ්‍ය දැන්වීම් *ගැසට් පත්‍රයක්* මගින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරමි.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 අප්‍රේල් මස

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කාර්යාලය* | *අයදුම්පත් කැඳවූ කොට්ඨාස හා තනතුරු* | *අයදුම්පත් කැඳවූ ගැසට් පත්‍රය පිළිබඳ විස්තර* |
|---|---|---|---|---|
| 01. | බදුල්ල | බදුල්ල | බදුල්ල නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍ය) | 2006.04.28 දින සිකුරාදා අංක 1443 දරන *ගැසට් පත්‍රය* |
| 02. | බදුල්ල | සොරනාතොට | සොරනාතොට කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වියළුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය ) රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධය) | එම |
| 03. | බදුල්ල | ලුණුගල | පට්ටිපොල කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ යටිකිඳ කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍ය) | එම |
| 04. | බදුල්ල | ලුණුගල | ඔය පළාත නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ වියළුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය)රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍ය) | එම |

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අයදුම්පත් කැඳවූ කොට්ඨාශ හා තනතුරු | අයදුම්පත් කැඳවූ ගැසට් පත්‍රය පිළිබඳ විස්තර |
|---|---|---|---|---|
| 05. | මහනුවර | පන්විල | පාතදුම්බර උඩගම්පහ නැගෙනහිර කොට්ඨාශයේ උප්පැන්න, මරණ සහ පාතදුම්බර කොට්ඨාශයේ විවාහ ( සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධූරය (දෙමළ මාධ්‍ය) | 2005.12.23 දින සිකුරාදා අංක 1425 දරන ගැසට් පත්‍රය |
| 06. | කොළඹ | කොළඹ | මෝදර කොට්ඨාශයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධූරය (දෙමළ මාධ්‍ය) | 2004.11.19 දින සිකුරාදා අංක 1368 දරන ගැසට් පත්‍රය |
| 07. | කොළඹ | කොළඹ | මරදාන කොට්ඨාශයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධූරය (දෙමළ මාධ්‍ය) | එම |
| 08. | කොළඹ | කොළඹ | කොම්පඤ්ඤවීදිය කොට්ඨාශයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධූරය (දෙමළ මාධ්‍ය) | එම |
| 09. | කොළඹ | තිඹිරිගස්යාය | කොළඹ මහ රෝහල කොට්ඨාශයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධූරය (දෙමළ මාධ්‍ය) | එම |
| 10. | කොළඹ | තිඹිරිගස්යාය | වැල්ලවත්ත කොට්ඨාශයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධූරය (දෙමළ මාධ්‍ය) | එම |
| 11. | කොළඹ | තිඹිරිගස්යාය | ද සොයිසා කාන්තා රෝහල, කොට්ඨාශයේ උප්පැන්න හා මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර්ධූරය ( දෙමළ මාධ්‍ය) | එම |

06 – 190

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## විදේශ කටයුතු අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2007

රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් (මෙහි මින් ඉදිරියට "සේවය" යනුවෙන් සඳහන් වන) ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට සුදුස්සන් තෝරා ගැනීමේ තරඟ විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹදී පවත්වනු ඇත.

02. *විභාග පරිපාටිය සහ දිනය :* මේ විභාගය කොටස් දෙකකින් පවත්වනු ලැබේ.

***I වන කොටස***

ලිඛිත විභාගයක් වන I වන කොටස මතු සඳහන් විෂය පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමන්විත කොට, 2007 සැප්තැම්බර් මස කොළඹ දී පවත්වනු ලැබේ.

(i) සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය
(ii) ලෝක කතු I
(iii) ලෝක කතු II
(iv) වාක්‍ය රචනය
(v) සාරාංශ ලිවීම
(vi) යෝග්‍යතාවය හා සාමාන්‍ය දැනීම (බහුවරණ ප්‍රශ්න පත්‍රය)

***II වන කොටස***

සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත විභාගයේදී ප්‍රශ්න පත්‍ර හයටම පෙනී සිට ලකුණු 300 කට අඩු නොවන පරිදි විදේශ කටයුතු ලේකම් විසින් නිගමනය කෙරෙන සීමාලම් ඉමට කෙරෙන හෝ ඉන් ඉහළට මුළු ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණි. එහෙත් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයකට නොවැඩි විය යුතුය. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් හිමි වේ.

03. *ඇබෑර්තු ගණන.—* මේ විභාගයේ ප්‍රතිඵල මත පිරවිය යුතු ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියේ ඇබෑර්තු ගණනත්, ඒවා පුරවන දිනයත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. ඇබෑර්තු කිසිවක් හෝ, සියල්ලම හෝ පිරවීමෙන් වැළකී සිටීම මහජන යහපත සඳහා සුදුසු යයි සලකතහොත් එසේ වැළකී සිටීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

04. *සේවා කොන්දේසි :—*

(අ) ඉහත 03 ඡේදයේ විධිවිධානවලට යටත්ව, මේ විභාගයේ ප්‍රතිඵල මත තෝරාගනු ලබන අයදුම්කරුවන්, රාජ්‍ය සේවයේ පත්වීම් කෙරෙහි බලපාන පොදු කොන්දේසි මත, වසර 2001 ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථා මාලාවට මෙතෙක් කර ඇත්තාවූ හෝ මින් ඉදිරියට කරනු ලබන්නා වූ හෝ සංශෝධන කිසිවක් වේනොත් ඒවා ද සමග එකී ව්‍යවස්ථා මාලාවේ දක්වා ඇති වගන්ති හා කොන්දේසිවලට යටත්ව සේවයේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

05. *වැටුප් ක්‍රමය (මාසික).—* රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - 53,555

ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් පහත සඳහන් මාසික වැටුප් තලයන්ට ලඟාවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ තුනකින් සමත් විය යුතුය.

| | |
|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම | රු. 24,225 ට පෙර |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | රු. 27,450 ට පෙර |
| තුන්වන කාර්යක්ෂමතා කඩඉම | රු. 31,965 ට පෙර |

06. *සෞඛ්‍ය සහ චරිතය.—* අයදුම්කරු මනා ශරීර සෞඛ්‍යයෙන් හා ඉතා යහපත් චරිතයකින් යුතු බවට විදේශ කටයුතු ලේකම්වරයා සෑහීමකට පත්විය යුතු අතර, ඔහු / ඇය සෞඛ්‍ය තත්වයෙන්, මෙරට හෝ ලෝකයේ ඕනෑම පෙදෙසක සේවය සඳහා සුදුසු ශාරීරික යෝග්‍යතාවයෙන් ද යුක්ත විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන්ට විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටින ලෙස නියම කෙරෙනු ඇත.

07. *යෝග්‍යතාවය - අයදුම්කරු / අයදුම්කාරිය,*

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා සිටිය යුතුයි.

*නැතහොත්*

(ii) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විදේශීය විශ්ව විද්‍යාලයකින් හෝ උපාධියක් ලබා සිටිය යුතුය. මේ සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලිඛිත සාක්ෂි සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු වේ.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 කට එළඹ සිටිය යුතු අතර අවුරුදු 30 ට නොඑළඹ සිටිය යුතුය. රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකු වේ නම්, ඔහු / ඇය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 40 ට නොඑළඹ සිටිය යුතු අතර, සතුටුදායක සේවා වාර්තාවක් ද ලබා සිටිය යුතුය.

*සටහන.– (I)* ඉහත 7 (ඇ) ඡේදයේ ප්‍රකාශිත අරමුණ වෙනුවෙන් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකු යනු (ආයතන සංග්‍රහයේ 1 පරිච්ඡේදයේ නිර්වචනය කොට ඇති පරිදි) අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට සේවයේ ස්ථිර කරන ලද මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධාරියකු හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු වේ.

*සටහන.– (II)* අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට පූර්වාසන්න වූ පස් අවුරුදු කාලය තුළදී හෝ, සේවයේ යෙදී සිටි කාලසීමාව ඊට අඩු නම් එම මුලු කාලසීමාවේ දී හෝ සතුටුදායක සේවා වාර්තාවක් ලබා තිබුණී නම් මිස, නැත්නම් දැනට රාජ්‍ය සේවයේ නියුතු කිසිදු නිලධාරියෙකු මේ විභාගයට පෙනී සිටීම සඳහා යෝග්‍ය නොවනු ඇත.

*සටහන.– (III)* රාජ්‍ය සේවයේ නිලධාරියෙකු, සතුටුදායක සේවා වාර්තා ලබා ඇති සේ සලකනු ලබන්නේ ඔහු / ඇය, අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට පෙරාතුව පස් අවුරුදු කාලසීමාව තුළ හෝ, තත් ආයතනයේ මුලු සේවා කාලය ඊට අඩු නම් එම මුළු කාලය තුළ හෝ යෙදුණු සියලු වැටුප් වර්ධක ද උපයාගෙන, එකී කාලසීමාව තුළ කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් (අවවාද කිරීමක් හැර) කිසිදු අන්දමක දඬුවමක් නොලැබ සිටියේ නම් පමණකි.

*සටහන.– (IV)* රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම අයදුම්පත් එවිය යුත්තේ තම තමන්ගේ අදාල දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මගිනි.

08. *විභාග ගාස්තුව.—* විභාගය සඳහා වූ ගාස්තුව රු. 300 ක් වනු ඇත. අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනයට පෙර, මේ ගාස්තුව ආදායම් ශීර්ෂ 2003-20-13 ට බැර වනු පිණිස ළඟම ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් හෝ, කොළඹ මහ භාණ්ඩාගාරයට හෝ ගෙවිය යුතු වේ. ගෙවීම සඳහා නිකුත් කරනු ලබන කුවිතාන්සිය අයදුම්පතට ඇමිණිය යුතුය.

*සැලකිය යුතුයි—* කවර හේතුවක් නිසා වුව ද විභාගයෙන් ඉවත්වන හෝ, නොපැමිණ සිටින හෝ විභාගයට පෙනී සිටීමෙන් පසු සුදුසුකම් නැත්තෙකු බවට දක්නට ලැබෙන හෝ යම් අපේක්ෂකයෙකුට විභාග ගාස්තුව මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට හිමිකමක් නැත.

09. *අයදුම් කරන පිළිවෙළ :-*

(අ) මේ දැන්වීමේ දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව අඟල් 8 1/2 x 12 (ඒ 4)කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය.

(ආ) අපේක්ෂකයා / අපේක්ෂිකාව විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිළියෙල විය යුතුය.

(ඇ) සම්පූර්ණ කරන ලද අයදුම්පත බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ (සංවිධාන හා විදේශ විභාග ශාඛාව) විභාගකොමසාරිස් ජනරාල් වෙත 2007 ජූලි 13 වන දා හෝ ඊට පෙර හෝ, ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුයි. අයදුම්පත බහා එවන කවරයේ වම්පස උඩ කෙලවරේ "ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය - 2007" යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතුයි. ලියුම් කවරයේ වම්පස උඩ කෙලවරේ (සෙ. මී. 2 x සෙ. මී. 2) ප්‍රමාණයේ කොටුවක් තුළ ඉංග්‍රීසි "S" අක්ෂරය සඳහන් කළ යුතුය. එකී දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක්, භාරගනු නොලැබේ.

(ඈ) සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ඉවත ලනු ලැබීමට ඉඩ ඇත. තැපෑලේදී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ, ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) අයදුම්පතක් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කල විගස ඒ බව දැක්වෙන දැන්වීමක් පුවත්පත්වල පල කරන හෙයින් අයදුම්කරුවන් ඒ ගැන සෝදිසියෙන් සිටීම යෙහෙකි.

(යම් අයදුම්කරුවෙකුට/කාරියකට විභාගය පැවැත්වෙන දිනයට දින 7ක් වත් තිබියදී තම ප්‍රවේශ පත්‍රය නොලැබුනොත් වහාම මතු සඳහන් තොරතුරු ද සමඟ ඒ බව බත්තරමුල්ල, පැලවත්ත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් (සංවිධාන හා විදේශ විභාග ශාඛාව), පැලවත්ත, බත්තරමුල්ල වෙත (විදුලි සංදේශ ලිපිනය විභාග - බත්තරමුල්ල) දැනුම් දිය යුතුය.

(අ) විභාගයේ නම
(ආ) අයදුම්කරුගේ සම්පූර්ණ නම
(ඇ) ලිපිනය
(ඈ) අයදුම්පත තැපැල් කළ දිනය, ලියාපදිංචි කල අංකය හා තැපැල් කාර්යාලය.

10. *විභාගයට ප්‍රවේශය.–*

(අ) අයදුම්පත් එවූ සුදුසුකම් සපුරා ඇති සියලුම දෙනාට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය විභාග

ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසරය දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට/ඇයට නියම කරන ලද විභාග ශාලාවේදී ය. සෑම අයදුම්කරුවකුම විභාගයට පෙනී සිටින පළමු දිනයේදී ම විභාගයට පෙනී සිටීමට පෙර එම විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට භාර දිය යුතුයි. සියලු අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මේ *ගැසට් පත්‍රයේ* පළවේ.

*සටහන.*-අයදුම්කරුවකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කළ පමණින් ඔහුට/ඇයට විභාගයට පෙනී සිටීමට සුදුසුකමක් තිබෙන බවක් නොහැඟේ.

11. *අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය-* අයදුම්කරු තමන් පෙනී සිටින එක් එක් විෂයය පාසා විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ඔහුගේ/ඇයගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතුවේ. මේ සඳහා මතු සඳහන් ලියවිලිවලින් කවරක් හෝ පිළිගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පතක් ;
(ආ) වලංගු ගමන් බලපත්‍රයක් ;
(ඇ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු තැපැල් හැඳුනුම් පතක්.

12. *අසත්‍ය තොරතුරු සැපයීම ගැන දණ්ඩන.–* යම් අයදුම්කරුවකු නුසුදුසු බව විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරේ දී හෝ විභාගය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අදියරකදී හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිවේ. යම් අයදුම්කරුවකු සැපයූ තොරතුරු ඔහු/ඇය දන්නා පරිදි අසත්‍ය බව හෝ, ඔහු/ඇය සිතා මතා යම් වැදගත් තොරතුරක් වසන් කළ බව හෝ දක්නට ලැබුනහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබීමට ඉඩ තිබේ.

13. *විභාගයේ භාෂා මාධ්‍යය*

(අ) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් පැවැත්වේ.

(ආ) අයදුම්කරුවකුට ඉහත දක්වා ඇති භාෂාවලින් එකකින් විභාගයට පෙනී සිටිය හැකිය. එසේ ද වුවත් ඔහු/ඇය තමන් තෝරා ගත් එක් භාෂාවකින් පමණක් සියලුම විෂයයන්ට පෙනී සිටිය යුතුය.

14. *පරීක්ෂණ ක්‍රමය :–*

(අ) I කොටස - ලිවීමේ විභාගය - මෙය පහත සඳහන් විෂයය හයකින් (06) සමන්විත වනු ඇත.

| | *විෂය* | *ගතවන කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| (i) | පොදු ප්‍රශ්න පත්‍රය | පැය 3 යි | 100 |
| (ii) | ලෝක තතු I | පැය 3 යි | 100 |
| (iii) | ලෝක තතු II | පැය 3 යි | 100 |
| (iv) | වාක්‍ය රචනය | පැය 3 යි | 100 |
| (v) | සාරාංශ ලිවීම | පැය 1/2යි | 50 |
| (vi) | යෝග්‍යතාවය හා සාමාන්‍ය දැනීම | පැය 2යි | 100 |

*ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය :–*

(i) *පොදු ප්‍රශ්න පත්‍රය.-* ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජයීය, සංස්කෘතික හා ආර්ථික පරිසරය පිළිබඳව, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන වත්මන් කරුණු පිළිබඳවත් විද්‍යාත්මක හා තාක්ෂණ සංවර්ධනය පිළිබඳවත් අයදුම්කරු ලබා ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. ප්‍රශ්න තෝරා ගැනීමේ අවස්ථාව අයදුම්කරුවනට ලැබේ.

(ii) *ලෝක විත්ති I.–* සමස්ත ලෝකයේ සාමය, ආරක්ෂාව හා සංවර්ධනය පිළිබඳ ප්‍රවණතා හා ඒවා ශ්‍රී ලංකාව කෙරෙහි බලපාන ආකාරය විග්‍රහ කිරීමෙහිලා අයදුම්කරු සතු හැකියාව නිශ්චය කිරීම සඳහා ලෝකයේ දේශපාලන සිදුවීම් එක්සත් ජාතීන්ගේ සංවිධානය හා වෙනත් ජාත්‍යන්තර සංවිධාන නැවුම් තත්වයක් හා නොයෙකුත් ජාතීන් හා ජාත්‍යන්තර ව්‍යාපාරවල දියුණුව අලලාවූ ප්‍රශ්නවලින් මේ ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. ප්‍රශ්න තෝරා ගැනීමේ අවස්ථාව අයදුම්කරුවනට ලැබේ.

(iii) *ලෝක විත්ති II.–* වෙළඳාම හා ආර්ථික සංවර්ධනයෙහි වර්තමාන ජාත්‍යන්තර සංවිධානවල කාර්ය භාරය ප්‍රවනතා කලාපීය ආර්ථික කණ්ඩායම්වල බලපෑම්, පරිසරය හා දැරිය හැකි සංවර්ධනය වැනි ප්‍රශ්න හා ඒවා ශ්‍රී ලංකාව කෙරෙහි අදාල වන අන්දම පිළිබඳ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් වේ. ප්‍රශ්න තෝරා ගැනීමේ අවස්ථාව අයදුම්කරුවනට ලැබේ.

(iv) *වාක්‍ය රචනය.–* නිශ්චිත විෂයය එකක් හෝ කීපයක් හෝ පිළිබඳ වාක්‍ය රචනයකි. අධ්‍යයන විෂය ක්ෂේත්‍රයකට සම්බන්ධ නොවන මේ ප්‍රශ්න පත්‍රය නිර්මාණය කරනු ලබන්නේ අපේක්ෂකයා/ අපේක්ෂිකාවගේ සාමාන්‍ය දැනීම සහ බුද්ධියත්, සිතීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ සාමාන්‍ය හැකියාවත් පරීක්ෂා කිරීම පිණිස ය. වාක්‍ය රචනය ලිවීමේදී උපයෝගී වූ සිහිබුද්ධියේ තත්ත්වයත්, විෂය පිළිබඳ ප්‍රතිභාවයත් එමෙන්ම භාෂා විලාශය හ ශෛලියත් කරුණු සංවිධානය කිරීමත් අනුව වාක්‍ය රචනය විනිශ්චය කරනු ලැබේ. එය කියවිය හැකි පරිදි පැහැදිලි අකුරෙන් ලිවිය යුතුය.

*සටහන .–* කරුණට අදාළ වන පරිදි පැහැදිලිව ලිවීමේ වැදගත්කම කෙරෙහි අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. විෂයය මනා පරීක්ෂණයට භාජනය කිරීම, විමසා බැලීමේ ශක්තිය, ලිවීමේ තත්ත්වය, තම අදහස් කෙටියෙන් පැහැදිලිව ප්‍රකාශ කිරීමේ ශක්තිය සඳහා ලකුණු හිමිවේ.

(v) *සාරාංශ ලිවීම.–* දී ඇති ඡේදයක අර්ථය අවබෝධ කරගෙන එය සිත් ඇදගන්නා ආකාරයෙන් සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමෙහිලා අයදුම්කරුගේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කොට ඇත.

(vi) *යෝග්‍යතාවය හා සාමාන්‍ය දැනීම.–* මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් පරිදි කොටස් දෙකකින් යුක්ත වේ.

*I කොටස*

(අ) අයදුම්කරුගේ තර්කානුකූල හේතු දැක්වීමේ හා විස්තර විභාග කිරීමේ හැකියා තක්සේරු කිරීම සඳහා (පැය 01 යි)

*II කොටස*

(ආ) දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් දේශපාලන, ආර්ථික හා සමාජ සංස්කෘතික ක්ෂේත්‍රවල වත්මන් සිදුවීම් පිළිබඳ අයදුම්කරුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා (පැය 01යි)

(ආ) *II කොටස සම්මුඛ පරීක්ෂණය* - සෑහෙන උසස් තත්ත්වයක ලකුණු ලබා ගන්නා අපේක්ෂක/අපේක්ෂිකාවෝ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබත්, ඊට හිමි ලකුණු ගණන 100කි. රාජ්‍ය සේවා කොමිසම විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් අපේක්ෂක/අපේක්ෂිකාවන් සාමාන්‍යයෙන් වැදගත්වන කරුණු සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. අපේක්ෂකයා/අපේක්ෂිකාව ඇතුළත් වීමට යන සේවයට ඔහුගේ/ඇයගේ යෝග්‍යතාවය මැන බැලීම සම්මුඛ පරීක්ෂණයේ අරමුණ වේ. මණ්ඩලය තම නිගමනයට එළඹීමේ දී අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ බුද්ධිය සහ මානසික උත්සුකතාවය කෙරෙහිත්, චරිත ශක්තිය කෙරෙහිත් විශේෂයෙන් සැලකිල්ලක් දක්වනු ලැබේ. අයදුම්කරුගේ අතිකූත් භාෂා ප්‍රවීනතාවය, උසස් අධ්‍යාපන සුදුසුකම් හා පරිසණක හැකියාව මෙම සම්මුක පරීක්ෂණයේදී ඇගයීමට ලක්කරනු ඇත.

15. *පත්වීම සඳහා තෝරා ගන්නා පිළිවෙල* - පත්වීම සඳහා තෝරා ගනු ලබන්නේ ලිඛිත විභාගයත්, සම්මුඛ පරීක්ෂණයත් යන දෙකෙන්ම ලබා ඇති මුළු ලකුණු ගණන මතය. පත්වීම සඳහා අවසානයට තේරීම කරනු ලබන්නේ විදේශ ලේකම්ගේ නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසිනි.

16. මෙම *ගැසට්* දැන්වීමේ සඳහන් නැති යම් කරුණක් වෙතොත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව විදේශ ලේකම් විසින් නිගමනය කරන පරිදි ඒ ගැන ක්‍රියා කරනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පාලිත ටී. බී. කොහොන,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය.

2007 මැයි මස 22 වැනි දින,
විදේශ කටයුතු අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.

## ආදර්ශ අයදුම්පත

## ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2007

විභාගයට පෙනී සිටින මාධ්‍යය (කරුණාකර S/T/E අදාළ කොටුව තුළ සඳහන් කරන්න.)

විභාග අංකය : (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

01. i. (අ) අගට යෙදෙන නම මුලකුරු සමග (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.

(ආ) අගට යෙදෙන නම මුලකුරු සමග (සිංහලෙන්/දෙමළෙන්) :——————.

ii. (අ) මුලකුරු වලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.

(ආ) මුලකුරු වලින් කියවෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :——————.

02. *ලිපිනය* :

(i) පදිංචි ස්ථානයේ (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.
(විභාග අයදුම්පත තැපැල් කරනු ලබන්නේ මෙම ලිපිනයටය)
(ii) කාර්යාලයීය :——————.
(iii) දුරකථන අංකය (කාර්යාලයීය) :——————.
(පුද්ගලික) :——————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

05. (i) උපන් දිනය :————. අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
(ii) අයදුම්පත් බාරගන්නා අවසාන දිනට වයස
අවුරුදු :————. මාස :————. දින :————.

06. ජාතිය :——————.

07. විවාහක/අවිවාහක බව : M/S [ ]

08. ශ්‍රී ලංකා විදේශ සේවයට පත්වීම සඳහා මීට පෙර යම් විභාගයකට පෙනී සිට ඇත්නම් අවුරුද්ද/අවුරුදු සඳහන් කරන්න.

(අ) ——————.
(ආ) ——————.
(ඇ) ——————.

09. ඔබ රාජ්‍ය සේවයේ, යම් තනතුරක් දරන උපාධිධාරියෙක් නම් එම තනතුරේ නම සඳහන් කරන්න. :——————.

උපාධිය පිළිබඳ විස්තර සහ එය පිරිනැමූ දිනය (මෙහිලා සුදුසුකම් තිබේදැයි දැනගනු පිණිස මේ දැන්වීමේ 7 (ආ) ඡේදය කියවා බලන්න.

(i) විශ්ව විද්‍යාලය/ආයතනය :——————.
(ii) උපාධියේ නම :——————.
(iii) උපාධිය පිරිනැමූ දිනය :——————.
(iv) සාමාන්‍ය/විශේෂ :——————.
(v) විෂයය :——————.
(vi) පන්තිය :——————.

11. අදාළ වන වෙනත් අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් ඇත්නම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා/විදේශ භාෂා ප්‍රවීනතාවය ආදිය) සඳහන් කරන්න.

12. මගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව මෙහි සඳහන් තොරතුරු සැබෑ බවත් විභාග ගාස්තු ගෙවීමෙන් ලැබූ .............................. දින අංක .......................... දරන කුවිතාන්සිය මීට අමුණා ඇති බවත්, මෙයින් ප්‍රකාශ කරමි. විභාගයට බලපවත්නා නියමයන්ටත්, විභාගයේ නීති රීති අනුව මා නුසුදුසු බව දක්නට ලැබුනොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරේදී හෝ, විභාගයෙන් පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයක් වෙතොත් ඊටත් අවනත වීමටද මම එකඟ වෙමි.

| |
|---|
| විභාග ගාස්තු ගෙවා ලබාගත් රිසිට් පත මෙහි අලවන්න. |

——————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

13. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :**

(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/පළාත් පාලන සේවයේ නියුතු අපේක්ෂකයකු/අපේක්ෂිකාවක් නම් පමණි.

........................මහතා/මෙනෙවිය/මිය ..................... දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලසීමාව තුළ (අ) තමාට හිමි සියලු වැටුප් වර්ධක උපයා ඇති බවත්, (අවවාද කිරීමක් හැර) කිසිදු විනය දඬුවමකට ලක්වී නැති බවත් සොයා බලා සැකහැර දැනගතිමි.

මේ අයදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බව ද සහතික කරමි.

මේ නිලධාරියා/නිලධාරිනිය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම මුදාහළ හැකි වේ.

..........................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ පදවිය

දිනය :—————.

06-187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.